**විෂය** - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**ශ්‍රේණිය**- 8

**මාසය** - මාර්තු **සතිය** - 01 **ක්‍රියාකාරකම් අංකය** - 09

**සැකසුම**- බී.ඒ.සී.ලක්ෂානි,කලාප අධ්‍යාපන කාර්යාලය,ඇඹිලිපිටිය

## 2- මෙහෙයුම් පද්ධතියක් භාවිතයෙන් පරිගණකයක් වින්‍යාස කිරීම සහ සිටුවම් කිරීම

### 2.1 පරිගණකයක දිනය ,වේලා කලාපය , මුදල් ඒකක හා සංඛ්‍යා ආකෘති සිටුවම් කිරීමේ වැදගත්කම

**ශිෂ්‍ය කාර්යය -**

- පහත උපුටා ගැනීම කියවා අවබෝධ කරගන්න.

> පරිගණකයක වඩාත් ඵලදායී ක්‍රියාකාරිත්වයක් සඳහා එහි දිනය, වේලා කලාපය, වේලාව, මුදල් ඒකක, සංඛ්‍යා සහ ඒවායේ ආකෘති (formats) ආදි දත්ත එය භාවිත කරනු ලබන රටට ගැළපෙන ලෙස සිටුවම් කර තැබීම වැදගත් ය.

- ඔබගේ කියවීම් පොතෙහි පිටු අංක 11,12 සහ 13 හොඳින් කියවා තේරුම්ගන්න.
- අමාරු/අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකු/ ගුරුවරයෙකු ගෙන් විමසා අවබෝධ කරගන්න.
- මෙහි දක්වා ඇති මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබාගෙන ඉගෙනගන්න.
- ඔබ සතුව පරිගණකයක් තිබේනම් වැඩ පොතෙහි 2.1 ක්‍රියාකාරකමට අදාළ පියවර අනුගමනය කරන්න.
- ක්‍රියාකාරකම් සිදුකිරීමේදී ඔබට එන ගැටළු ඔබේ යහළුවන්, වැඩිහිටියන් හා ගුරුවරුන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාගන්න.

**මෙම පාඩමට අදාළව උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක -**

- ගුරු ගෙදර- https://youtu.be/GUNOFJ-YrX4
- e නැණපියස - https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=21081
  https://www.enenapiyasa.lk/lms/pluginfile.php/14270/mod_resource/content/1/2
- වෙනත් -
  - Youtube- https://www.youtube.com/watch?v=ml9W4gYbT5k
  - සවියෙන් පෙරට - අපි එකට e- ඉගෙනුම් පාසල හොරණ අධ්‍යාපන කලාපය - https://drive.google.com/file/d/1LW4IrbdeoyTvbGA3NYxaDSBin7pi_n1f/view

**මෙම පාඩම තුළින් ලබාගත හැකි ඉගෙනුම්ඵල -**

- පරිගණකයක දිනය, වේලා කලාපය සිටුවම් කරයි.
- පරිගණකයක මුදල් ඒකක සහ සංඛ්‍යා ආකෘති සිටුවම් කරයි.
- පරිගණකයක දිනය, වේලා කලාපය, මුදල් ඒකක සහ සංඛ්‍යා ආකෘති සිටුවම් කිරීමේ වැදගත්කම හඳුනා ගනියි.
- හොඳින් කියවා සහ සවන් දී අවබෝධයෙන් යුතුව පිළිතුරු සපයයි.

**ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය -**

1. පරිගණකයක දිනය, වේලා කලාපය, මුදල් ඒකක සහ සංඛ්‍යා ආකෘති සිටුවම් කිරීමේ පියවර වෙන වෙනම දැක්වෙන පෝස්ටරයක් නිර්මාණය කරන්න. පාසල ආරම්භ කළ පසු පන්තියට ඉදිරිපත් කරන්න.
2. e නැණපියස අන්තර්ක්‍රියාකාරී ක්‍රියාකාරකම සිදු කරන්න.
   https://www.enenapiyasa.lk/lms/mod/h5pactivity/view.php?id=10647
3. පරිගණකයක දිනය, වේලා කලාපය, මුදල් ඒකක සහ සංඛ්‍යා ආකෘති සිටුවම් කිරීමේ වැදගත්කම් 3ක් ලියන්න.